**පෙර සවි යකඩ පාලම් සැපයීම හා ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2013**

-----------------------------------------------------------------

පෙර සවි යකඩ පාලම් සැපයීම හා ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ස්පාඤ්ඤ රජය අතර 2006 සැප්තැම්බර් 04 දින එලඹි අංක 2006086/87 දරන ණය ගිවිසුම යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------

පෙර සවි යකඩ පාලම් සැපයීම හා ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන්නේ මාර්ග සංවර්ධන අධිකාරියයි. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, ත්‍රිකුණාමලය පුල්මොඩෙයි මාර්ගයේ ඉරක්කන්ඩි , පුඩවාක්කඩු සහ යාන් ඔය නව පාලම් ඉදිකිරීම සහ සුනාමියෙන් හානි වූ හෝ සේදී ගිය මඩකලපුව , ත්‍රිකුණාමලය මාර්ගයේ ඔඩ්ඩමාවඩි පාලම ප්‍රතිස්ථාපනය කිරීමයි. සැලපියරි පාලම, තොන්ඩමනාරු පාලම, ඔරිගන් පාලම, තෝප්පූර් පාලම සහ තඹලකමම් පාලම ප්‍රතිසංස්කරණය සඳහා ඉහත ණය මුදලේ ඉතිරිය භාවිතා කිරීමට ස්පාඤ්ඤ රජය අනුමත කර තිබුණි. ණය ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 3,228.54 ක් වූ අතර ඉන් යූරෝ මිලියන 21.627 කට සමාන රු. මිලියන 2,888.54 ක්, එනම් 89 ක ප්‍රතිශතයක් මූල්‍යයනය කිරීමට ස්පාඤ්ඤ රජය එකඟ වී තිබුණි. 2006 සැප්තැම්බර් මාසයේදී ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2010 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2010 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වුවද ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2015 දෙසැම්බර් 31 දක්වා තවදුරටත් දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

-------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය

විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම් , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව. සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

( අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු. මිලියන 8.92 ක් වූ අතර , 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. මිලියන 3,626.7 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, පෙර වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| මෝටර් වාහන | - | - | 5,222,893 |
| නිම කරන ලද සිවිල් වැඩ | - | - | 3,585,994,566 |
| කෙරීගෙන යන වැඩ | 8,920,106 | 9,280,060 | 35,527,608 |
| | 8,920,106 | 9,280,060 | 3,626,745,067 |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

රු.522,893 ක් වටිනා මෝටර් වාහන සමාලෝචිත වර්ෂය තුළදී මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කර තිබුණි. කෙසේ වුවද වත්කම් මාරු කිරීමට අදාළ ලියකියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

ව්‍යාපෘතියේ මූල්‍යායන සැලැස්ම, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සම්බන්ධයෙන් වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සලසන ලද ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ සමුච්චිත අරමුදල් |
|---|---|---|---|---|---|
| | යූරෝ මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ස්පාඤ්ඤය | 21.62 | 2,888.54 | - | - | 3,393 |
| ශ්‍රී ලංකා රජය | - | 340.00 | 9.00 | 8.92 | 234.00 |
| එකතුව | 21.62 | 3,228.54 | 9.00 | 8. 92 | 3,627.00 |

## 6.2 නිශ්ඵල ගනුදෙනු

ව්‍යාපෘතියේ වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සලසා නොතිබුණද ව්‍යාපෘතිය විසින් ඉදිකරන ලද තොන්ඩමනාරු පාලම විවෘත කිරීමේ උත්සවය සඳහා ව්‍යාපෘතිය විසින් රු. මිලියන 1.52 ක මුදලක් වැයකර එය ව්‍යාපෘති පිරිවැය ලෙස සලකා තිබුණි.

## 6.3 ව්‍යාපෘතියේ කටයුතු වසා දැමීම

ව්‍යාපෘතිය විසින් ඉදිකිරීමට අපේක්ෂා කර තිබූ පාලම් 09 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසානයට නිම කර තිබුණද, ව්‍යාපෘති කටයුතු අවසන් කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් පියවර ගෙන නොතිබුණි.